# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2238/28 - 2021 ජූලි මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2021.07.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

### සුරාබදු නිවේදනය

### ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය

සංශෝධිත (52 වන අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 8 වන සහ 30 වන වගන්ති සමඟ කියවිය යුතු 32 වන වගන්තිය යටතේ මුදල් විෂයභාර අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අංක 2178/4 දරන 2020 ජුනි මස 01 වැනි දිනැති *ගැසට් පත්‍රය* මගින් අවසන් වරට සංශෝධනය කරන ලද පරිදි, අංක 2128/30 දරන 2019 ජුනි මස 20 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 04/2019 දරන සුරාබදු නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද පරිදි, පහත රීති පනවන අංක 2208/34 දරන 2021 ජනවාරි මස 01 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 01/2021 දරන සුරාබදු නිවේදනය, 2021 අප්‍රේල් මස 20 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. 3 වන රීතියේ,

   (අ) පළමු අතුරුවිධානයේ (ii) වන ඡේදයේ සඳහන් ''දෙසැම්බර් 31, 2020'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''ජුනි 30, 2021'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම, සහ

   (ආ) දෙවන අතුරුවිධානයේ (ii) වන ඡේදයේ සඳහන් ''දෙසැම්බර් 31, 2020'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''ජුනි 30, 2021 '' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම.

2. 13 වන රීතියෙහි සඳහන් ''දින පන්සිය හැට එකක් (561)'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''දින හත්සිය හතළිස් දෙකක් (742)'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම.

**එස්. ආර්. ආටිගල,**
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2021 ජූලි 29 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

08 - 204


1A - G 34762 — 35 (2021/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*